72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2024 මැයි 29
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව. 05:00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**


ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# අප්‍රේල් මාසයේදී ස.ජ.බ. සහ ජා.ජ.බ./ජ.විපෙ. වැඩිහිටි ඡන්දදායකයින්ගෙන් 34% බැගින් වන සහයෝගයක් ලබා ගනිමින් කරට කර සිටී

## *2024 අප්‍රේල් IHP MRP* මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම

IHP SLOTS MRP ආකෘතියේ නවතම ඇස්තමේන්තු (01/2024 හි සංශෝධිත) මඟින් අප්‍රේල් මාසයේදී ස.ජ.බ. (+1) සහ ජා.ජ.බ./ජ.විපෙ. (-3) යන දෙපක්ෂයටම ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගෙන් 34%ක සහයක් ලැබී ඇති බව පෙන්වයි. 2023 ජූලි මාසයේ සිට ජා.ජ.බ./ජ.විපෙ. සහ ස.ජ.බ. සඳහා සහයෙහි සුළු වශයෙන් වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. එ.ජා.ප., ශ්‍රී.ල.පො.පෙ., ශ්‍රී.ල.නි.ප., දෙ.ජා.ස., ශ්‍රී.ල.මු.කො. සහ "වෙනත්" පක්ෂ සඳහා ඡන්දදායකයින්ගේ සහයෝගය සාපේක්ෂව නොවෙනස්ව පවතී. අප්‍රේල් ඇස්තමේන්තු තාවකාලික වන අතර ප්‍රමුඛ පක්ෂ හතර සඳහා 1-4% ක දෝෂ ආන්තිකයක් සමඟ ගණනය කර ඇත.






IHPහි අප්‍රේල් නිකුතුව හා සසඳන විට, 2024 මාර්තු මාසය සඳහා ජා.ජ.බ. සහ ස.ජ.බ.හි සහය සඳහා IHP ඇස්තමේන්තු +2 සහ -5 බැගින් සංශෝධනය වී ඇත.

SLOTS මත විමසීම් අධ්‍යක්ෂ වෛද්‍ය රන්නන්-එලිය මහතා මෙසේ අදහස් දැක්වීය: "අලුත් අවුරුදු නිවාඩුව හේතුවෙන් අප්‍රේල් මාසය තුළ මත විමසීමට අඩු ප්‍රතිචාර දැක්වීමක් තිබූ බවත්, එය ස.ජ.බ. සඳහා නියැදිය නැඹුරු වන්නට හේතු විය හැකි බවත්ය. මේ සඳහා මැයි මස මුල සිදුකළ සම්මුඛ පරීක්ෂණ ගැළපීමට උපකාරී වූ අතර, ජුනි මස පවත්වන සම්මුඛ පරීක්ෂණ මඟින් ද තවදුරටත් ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය."

වෛද්‍ය රන්නන්-එලිය මහතා තවදුරටත් අදහස් දක්වා ඇත්තේ: "ජා.ජ.බ./ජ.විපෙ. සඳහා වැඩි සහයෝගයක් පෙන්වන මෑත කාලීන අන්තර්ජාල මත විමසුම් කිහිපයක් පිළිබඳ අපෙන් විමසා ඇත. අපට හැඟෙන්නේ මෙම මත විමසුම් මඟින් ජා.ජ.බ./ජ.විපෙ. සඳහා සහය අධිතක්සේරු කර ඇති බවයි. SLOTS මඟින් සියළුම ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඔවුන්ට අන්තර්ජාල ප්‍රවේශය තිබේද යන්න සහ ඔවුන් අන්තර්ජාල සමීක්ෂණයන්ට සහභාගී වීමට කැමතිද යන්න පිළිබඳ දත්ත සාමාන්‍යයෙන් එකතු කරයි. මෙම දත්ත මඟින් පෙන්නුම් කරන්නේ ජා.ජ.බ./ජ.විපෙ. පාක්ෂිකයන්ට අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් බොහෝ දුරට ඇති බවත් සහ අන්තර්ජාල සමීක්ෂණයන්ට සම්බන්ධ වීමට ඔවුන් වඩා වැඩි කැමැත්තක් දක්වන බවය. මෙම වෙනස ඔවුන්ගේ පෙර ඡන්දය ප්‍රකාශ කිරීම් සමඟ සැසඳීමේදී පවා දක්නට ලැබේ. අපගේ දත්ත පෙන්වා දෙන්නේ අන්තර්ජාල ඡන්ද විමසීම් මගින් ජා.ජ.බ./ජ.විපෙ. සහය 10% කින් පමණ අධිතක්සේරු කළ හැකි බවත් මෙවැනි හේතූන් නිසා අන්තර්ජාල ඡන්ද විමසීමක් කිරීමට මෙය සුදුසු අවස්ථාවක් නොවන බව අප කලින් තීරණය කළ බවත්ය".

මෙම SLOTS ඇස්තමේන්තු සියලුම වැඩිහිටියන් සඳහා වන අතර අපේක්ෂිත ඡන්දදායකයින් සඳහා නොවේ. 2024 ජනවාරි මස IHP SLOTS MRP ආකෘතියේ සිදු කළ සංශෝධනයක් මත මෙම ඇස්තමේන්තු පදනම් වී ඇත. IHP මඟින් අපේක්ෂිත ඡන්දදායක ආකෘතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් සිටින අතර අනාගත යාවත්කාලීන කිරීමකදී අපේක්ෂිත ඡන්දදායකයින්ගේ ඡන්ද අභිප්‍රාය පිළිබඳ නිකුත් කිරීම නැවත ආරම්භ කරනු ඇත. නමුත් පසුගිය වසර දෙක තුළ බොහෝ ඇස්තමේන්තු සඳහා සියලුම වැඩිහිටියන් සහ අපේක්ෂිත ඡන්දදායකයින් අතර ඡන්ද අභිප්‍රායන්හි වෙනස සාමාන්‍යයෙන් 1-2% ක් වී ඇති බව සටහන් කළ යුතුය.

මෙම 2024 අප්‍රේල් යාවත්කාලීන කිරීම පදනම් වී ඇත්තේ 2024 අප්‍රේල් මාසයේ සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණ 444ක් ඇතුළුව, 2021 ඔක්තෝබර් සිට ශ්‍රී ලංකාව පුරා වැඩිහිටියන් සමඟ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 17,134ක් මත ය. IHP SLOTS MRP ක්‍රමවේදය තුළදී ප්‍රථමයෙන් 'multilevel statistical model' මඟින් ප්‍රතිචාර දක්වන්නන්ගේ විවිධ ලක්ෂණ සහ ඔවුන්ගේ අදහස් අතර සම්බන්ධය ඇස්තමේන්තු කරයි, මෙහිදී 'අද මහ මැතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කුමන පක්ෂයටද' යන්න යොදා ගෙන ඇත. පසුව එය 2021 ඔක්තෝබර් සිට සෑම මාසයකම ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය පුරෝකථනය කිරීමට ('post-stratification') ජාතික ජනගහනයට ක්‍රමාංකනය කරන ලද විශාල දත්ත ගොනුවක් භාවිතා කරන ලදී. Multilevel model පවතින අවිනිශ්චිතතාවයන් පිළිබිඹු කිරීමට සහ දෝෂ ආන්තිකය ලබා ගැනීමට ආකෘතිය 100 වතාවක් ඇස්තමේන්තු කර ඇත.

පෙර වාර්තාවන් **ihp.lk** වෙතින් ලබා ගත හැකිය

Institute for Health Policy, March 2023, “IHP MRP Voting Intentions Estimates February 2023. Voters consolidate around the NPP/JVP, SJB and ITAK, with NPP/JVP taking a clear lead”, SLOTS Report #2023-06.
*Available at:* *https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf*

Institute for Health Policy, April 2023, “Little change in voting preferences in March, with NPP/JVP maintaining a clear lead over SJB, amidst possible signs of a UNP rise. IHP MRP General Election Voting Intentions Update March 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230419.pdf*

Institute for Health Policy, May 2023, “NPP/JVP maintains a lead, but loses support to UNP and other parties, whilst SJB flatlines. IHP MRP General Election Voting Intentions Update April 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230525.pdf*

Institute for Health Policy, June 2023, “NPP/JVP support fell to 23% behind SJB on 26%, whilst support for UNP and SLPP rises amongst likely voters during May 2023. IHP MRP General Election Voting Intentions Update May 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306301.pdf*

Institute for Health Policy, July 2023, “Support for NPP/JVP and SJB fell, with evidence of growing vote disillusionment with all established parties in June 2023. IHP MRP General Election Voting Intentions Update June 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230727.pdf*

Institute for Health Policy, August 2023, “Support for major parties changes little in July, with NPP/JVP and SJB ahead, but large numbers of voters uncommitted. IHP MRP General Election Voting Intentions Update July 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230821.pdf*

Institute for Health Policy, September 2023, “NPP/JVP retain an edge over the SJB amongst voters in August. IHP MRP General Election Voting Intentions Update August 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230925.pdf*

Institute for Health Policy, October 2023, “NPP/JVP leads with 42% of likely voters, ahead of the SJB (22%) and UNP (13%) in September. IHP MRP General Election Voting Intentions Update September 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231023.pdf*

Institute for Health Policy, November 2023, “Little change in voter intentions in October, with NPP/JVP consolidating its lead at 40%. IHP MRP General Election Voting Intentions Update October 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231123.pdf*

Institute for Health Policy, January 2024, “NPP/JVP on 39% of all adults, ahead of SJB (27%) and SLPP (10%) in December ’23. IHP MRP General Election Voting Intentions Update December 2023”. *Available at:* https://ihp.lk/press-releases/nppjvp-39-all-adults-ahead-sjb-27-and-slpp-10-december-23

Institute for Health Policy, February 2024, “NPP/JVP maintains lead in voting intentions, with continuing increase in SJB support. IHP MRP General Election Voting Intentions Update

January 2024”. *Available at:* https://ihp.lk/press-releases/nppjvp-maintains-lead-voting-intentions-continuing-increase-sjb-support

Institute for Health Policy, March 2024, “NPP/JVP (44%) and SJB (30%) continue to consolidate support in February 2024. IHP MRP General Election Voting Intentions Update February 2024”. *Available at:* https://ihp.lk/press-releases/nppjvp-44-and-sjb-30-continue-consolidate-support-february-2024

Institute for Health Policy, April 2024, “Increasing support for SJB (38%) pushes it ahead of NPP/JVP (35%) in March 2024. IHP MRP General Election Voting Intentions Update March 2024”. *Available at:* https://ihp.lk/press-releases/increasing-support-sjb-38-pushes-it-ahead-nppjvp-35-march-2024

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි වෛද්‍ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**විස්තරාත්මක ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් සහ මුහුණට මුහුණ සම්මුඛ පරීක්ෂණ මඟින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2024 අප්‍රේල් MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 444ක් ඇතුළුව 2021 ඔක්තෝම්බර් 1 සිට 2024 මැයි 19 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 17,134ක් මත පදනම් වේ. එ.ජා.ප., ශ්‍රී.ල.පො.පෙ., ශ්‍රී.ල.නි.ප., ශ්‍රී.ල.මු.කො., ල.ක.කො., දෙ.ජා.ස. සහ “වෙනත්” පක්ෂ සඳහා 0.7-1.8%ක සහ ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සඳහා 3.7-4.0%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු ගණනය කර ඇත. දෝෂ ආන්තිකය තක්සේරු කිරීම සඳහා ආකෘති නිර්මාණයේදී stochastic simulations 100ක් භාවිතා කරන ලදී.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයන ලදී. IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය දක්වයි. අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. තවද, සමීක්ෂණයේ සොයාගැනීම් හරහා අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.